# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1657/7 – 2010 ජුනි 07 වැනි සඳුදා – 2010.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2005 ජනවාරි මස 26 වැනි දින අංක 1377/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයෙහි පළ කරන ලද 2005 අංක 03 දරන (460 වන අධිකාරිය වු) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් අතුලත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියේ උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2003/ඩබ්එස්/536.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 3/3/1/32.
2010 මැයි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, ''ගොවිජන මන්දිරය'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුකහ උතුර කෝරලේ සුළු කොට්ඨාසයේ දම්පැලැස්ස ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේග්‍යු/එන්ආර්එම්/2004/117 සහ 2004.05.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0142ක් පමණ වූ පිංහේන වත්ත නැමති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. කැබලි අක්ෂර 'ඒ' – පිංහේන වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0142 ක්

උතුරට: පිංහේනවත්ත; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අධි); දකුණට සහ බටහිරට: පිංහේන වත්ත.

06 – 493

---

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2010 අංක 59 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2007/ඩබ්එස්/392.

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: අම්/ඉ/2/7/26.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම

ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2010 මැයි මස 26 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, අම්බලන්තොට.

2. **ඉඩමේ විස්තරය.**– හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවා සුළු කොට්ඨාසයේ, තවාළුවිල (අ.ග.පි. 466) ගමේ පිහිටි හම්බන්තොට කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් 2008.07.09 දිනැතිව සකස් කර ඇති අංක එච්/ඒඑම්බී/2008/326 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ', 'බී', 'සී' වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0450 ක් පමණ වූ "කච්චේරිය වත්ත" නැමති පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් සහ මායිම් වලින් යුක්ත ඉඩම් කොටස්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ප්‍රමාණය: හෙක්. 0.0130 ක් පමණ**

උතුරට: වලිමුණිගේ ප්‍රියන්ත යන අය හිමිකම් කියන කච්චේරිය වත්ත ඉඩම ද; නැගෙනහිරට: වලවේ ගඟ ද; දකුණට: වලවේ ගඟ, ප්‍රගමණ අනුරේඛන අංක එච්/ඒඑම්බී/2008/326 හි කැබලි අක්ෂර බී හා ආර්. ඒ. ජී. සිරිසේන, ආර්. හරිස්චන්ද්‍ර, ආර්. ඒ. ප්‍රියානි යන අය හිමිකම් කියන කච්චේරිය වත්ත; බටහිරට: ආර්. ඒ. ජී. සිරිසේන, ආර්. ඒ. හරිස්චන්ද්‍ර, ආර්. ඒ. ප්‍රියානි යන අය හිමිකම් කියන කච්චේරිය වත්ත ඉඩම හා වලිමුණිගේ ප්‍රියන්ත යන අය හිමිකම් කියන කච්චේරිය වත්ත ඉඩම ද වේ.

06 – 494

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2009 අංක 185 දරන ආඥාව**

මගේ අංකය: එල්ඩී/05/2007/එෆ්එච්/248.

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/9/ධීවර.

අංක 1612/2 සහ 2009.07.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ 1 ඒ පිටුවේ පළ කරන ලද ඉහත ආඥාවෙහි 38 වගන්තිය (අ) යටතේ ආඥාව යන්න ඉවත් කොට ඒ වෙනුවට 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව වශයෙන් ද එහි සඳහන් ඉඩමේ විස්තරයෙහි "හිරේවත්ත ගමේ පිහිටි" යන්න ඉවත් කොට ඒ වෙනුවට "පටබැඳිමුල්ල ගමේ පිහිටි" යන්න වශයෙන් ද ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

06 – 495

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.